මනෝවිද්‍යාව

# මිනිසුන් රෝගී කරවන මෝදකය

**මනෝවෛද්‍ය සරත් පඬුවාවල**

මෝදක යනු ආයුර්වේද ඖෂධ කාණ්ඩයකි. මෙම කාණ්ඩයේ අන්තර්ගතයට, අභයාදි, අමාවාත ගජසිංහ, කංසහරිතකි, කාංකායන, කාමේශ්වරි, ගෝක්ෂණදී, මදන, මාණිභද්‍ර ආදී නම්වලින් යුත් මෝදක අයත් වේ. සමාජමය වශයෙන් වැදගත් වන්නේ මදන මෝදකය යනුවෙන් හඳුන්වා ගුලි වශයෙන් පොලිතින් පැකට්වල අසුරා මෙරට සෑම කඩයක ම පාහේ විකිණීමට තබා ඇති ද්‍රව්‍යය යි. එසේම යම් යම් මානසික රෝගී තත්ත්වයනට ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන, රෝගීන් තම රෝගී තත්ත්වය ඇතිවීමට ප්‍රථමයෙන් මෙම ද්‍රව්‍යය වරක් හෝ කිහිප වරක් භාවිත කර ඇති බව පැවසීම නිතර දකින්නට ලැබෙන්නකි.

දේශීය හා ආයුර්වේද ඖෂධ ක්වාථ, අරිෂ්ඨ, ආසව, තෛල, ඝෘත, කල්ක, චූර්න, පර්පටි, රස, අවලේහ ආදී වූ කාණ්ඩ මෙන්ම මෝදක නම් වූ කාණ්ඩයකින් ද යුක්ත ය. මෝදක අතර කාමේශ්වරි හා මදන මෝදක සාමාන්‍ය ජනතාව අතර ඉතා ප්‍රචලිත ය. බොහෝවිට මීට හේතුවනවා විය හැක්කේ මෙහි කාම ශක්තිය වඩවන බවට වූ ප්‍රකාශය විය හැකි ය. මින් වැඩි වශයෙන් භාවිතා වන්නේ මදන මෝදකය යි.

ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කර ඇති ආයුර්වේද ඖෂධ සංග්‍රහයට අනුව මදන මෝදකය යනු තිකුළු (ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි) තිපල් (අරළු, බුළු, නෙල්ලි) කකුළු සුඟු (කර්කටකසිංගි) කොට්ටම්, කොත්තමල්ලි, සවිඳ ලුණු, ශඨී (ඉඟුරු පියළි) තාලිස පත්‍ර, කට්එල, නාමල් රේණු, අසමෝදගම් (යවානි) වැල්මී, උළුහාල්, දෙදුරු (සුදුරු, කළුදුරු) හා කංසා යන ද්‍රව්‍ය වලින් සාදනු ලබන ඖෂධයකි. මෙහි විශේෂත්වය වනුයේ මුළු ද්‍රව්‍ය 15 වර්ගයේ සම්පූර්ණ බර හා සමාන ප්‍රමාණයක් කංසා භාවිත කිරීම යි. එනම් වේලකට භාවිත කරන ඖෂධ ප්‍රමාණයෙන් භාගයක් කංසා වීම යි.

> කංසා හෙවත් ගංජාවල මොළයේ සංවේදන ක්‍රියාවලියට සම්බන්ධ ස්නායු සෛලවලට බලපෑම් කළ හැකි සංයෝග අඩංගු ය. මෙම ද්‍රව්‍ය ශරීරගත වීමෙන් පැය 1 / 2 ක් පැයක් පමණ වේලාවක් තුළදී මානසික ව්‍යාකූල බව, ශ්‍රවණය කාලවේලා ගතවීම ආදිය පිළිබඳ අස්වාභාවික තත්ත්ව අවධානය යොමු කිරීමේ අපහසුව ඇතුලු විවිධ සංවේදන වෙනස්කම් අත්දැකීමට පුළුවන

තරුණ පාසල් ළමුන්ගේ සිට විවිධ වයස් මට්ටම්වල සිටින අය මදන මෝදකය වෙළඳපොලින් මිලදී ගෙන භාවිත කරති. මෙය ජනයා අතර ප්‍රචලිත වීම පිළිබඳ ඉතිහාසය සලකා බැලුවොත් දශක කිහිපයක අතීතයේ සිට සිංහල පුවත්පත් මගින් විවිධ නම්වලින් යුතුව, කාම වර්ධනය හා ශරීර වර්ධනය ආදිය ගැන සඳහන් කරමින් සිංහලයින් හා අලින් ඔසවා ගත් මස් පිඩු වර්ධනය කරගත් මිනිසුන්ගේ රූප සහිතව දේශීය වෛද්‍යවරුන්යයි කියාගත් පිරිසක් දැන්වීම් පළ කිරීම දක්වා දිවයනු ඇත.

නින්දෙන් ශුක්‍ර පහවීම , නිතර සවයං වින්දනයේ යෙදීම හා තමා කෙට්ටුයයි සිතන්නන් මදන මෝදකය භාවිත කරන සිසුන් අතර සිටින බව වෛද්‍ය ප්‍රතිකාර පතා එන්නන් සමග කරන ලද සාධකවලින් පෙනී ගොස් තිබේ. ලිංගික අප්‍රාණිකත්වයෙන් පෙළෙන වැඩිහිටියන් හා වැඩිපුර ලිංගික ශක්තියක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින විවාහකයින් ද මදන මෝදකය භාවිතා කරන්නන් අතර වෙති.

කංසා හෙවත් ගංජාවල මොළයේ සංවේදන ක්‍රියාවලියට සම්බන්ධ ස්නායු සෛලවලට බලපෑම් කළ හැකි සංයෝග අඩංගු ය. මින් ප්‍රධාන තැනක් ගන්නේ ටෙට්‍රාහයිඩ්‍රෝකැනබිනෝ, නම් වූ රසායන ද්‍රව්‍යය යි. මෙය මේදයෙහි ද්‍රාවනය වන බැවින් ශරීරගත වූ විට මසකට වැඩිකලක් ශරීරයේ පටක තුළ පැවතිය හැකි ය. මෙම ද්‍රව්‍ය ශරීරගත වීමෙන් පැය 1 /2 පැයක් පමණ වේලාවක් තුළදී මානසික ව්‍යාකූල බව, ශ්‍රවණය කාලවේලා ගතවීම ආදිය පිළිබඳ අස්වාභාවික තත්ත්ව අවධානය යොමු කිරීමේ අපහසුව ඇතුලු විවිධ සංවේදන වෙනස්කම් අත්දැකීමට පුළුවන. බොහෝවිට ශරීරයේ බර කි. ග්‍රෑමයට ගංජා මිලිග්‍රෑම් 0.2 පමණ ප්‍රමාණයක් ශරීරගත වූ විට ඉහත කී වෙනස්වීම් හටගැනීමට පුළුවන. ඉතා සුළු ප්‍රමාණවලින් මෙවැනි විපර්යාස ඇති නොවනවා විය හැකි ය. මසකට ගංජා ග්‍රෑම් 60 කට වඩා භාවිතා කරන පුද්ගලයන්ගේ මානසික තත්ත්වයන්හි තදබල ;වනස්වීම් ඇති වන බව පෙනීගොස් තිබේ. ඉහත සඳහන් කළ පරිදි ගංජාවල අඩංගු ටෙට්‍රාහයිඩ්‍රොකැනබිනෝල් මේදයේ ද්‍රාව්‍ය බැවින් සුලු ප්‍රමාණවලින් දිනපතා භාවිතා කිරීමෙන් මොළපටකයේ ?ඳෙන මෙහි සාන්ද්‍රණය ක්‍රමයෙන් වැඩිවීම මගින් මානසික වෙනස්වීම් හටගැනීමට පුළුවන.

සමහර ආයුර්වේද වෛද්‍යවරුන් පවසන අන්දමට වෙළෙඳපොළෙහි විකිනීමට ඇති මදන මෝදකය නිවැරදි අයුරින් නිෂ්පාදනය නොකෙරේ. ආයුර්වේද ඖෂධ සංග්‍රහයට අනුව මදන මෝදකයට කංසා සංයෝග කිරීමේදී එහි ඇට සහ කොල ගිතෙලින් බැද ගත යුතු ය. නමුත් වෙළෙඳ නිෂ්පාදනයේදී මෙසේ නොකරන බවත්, ඊට අමතරව භාවිතා කරන්නන්ට මත්ගතියක් හෝ වෙනයම් වින්දනයක් ලැබෙන පරිදි අන්තන ඇතුළු වෙනත් ද්‍රව්‍යයන් ද ඊට එකතු කරන බවත් ඔව්හු ප්‍රකාශ කරති. මේ නිසා කංසා අඩංගු අයුරේවේද ඖෂධ සම්පූර්ණයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පමණක් නිෂ්පාදනය කළ යුතුබව ඔවුන්ගේ අදහස යි. මේ සඳහා අවශ්‍ය නීති දැනට සම්පාදනය කෙරෙමින් පවතින බවද දැනගන්නට ලැබින.

යමෙකුට ලිංගික වශයෙන් හෝ වෙනයම් ශාරීරික ගැටළු ඇත්නම් ඒවා යම් යම් පුද්ගලයින්ට පවසා ඔවුන් දෙන උපදෙස් (උද : මදන මෝදකය භාවිත කර බැලීම වැනි) පිළිපැදීම අනතුරුදායක බවත් එවැනි දේට කාරනා දත් අයෙකුගෙන් උපදෙස් ද ලබා ගැනීම සුදුසු බව සියලු දෙනාට ම වැටහෙනු ඇත.

මෙහි දක්වා ඇත්තේ මෝදක යන නාමයෙන් ඇති නිෂ්පාදන හා වෙනත් කංසා අඩංගු ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, බෙද හැරීම හා වෙළඳම් කිරීම පිළිබඳ අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලයේ සභාපති විසින් නිකුත් කරනු ලැබ ඇති දැන්වීමකි. ❑